ද මැසිනොද් විදුහල - කඳාන

**De Mazenod College - Kandana**

21 S I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 12 ශ්‍රේණිය

2016 නොවැම්බර් පරීක්ෂණය

24.11.2016

# ආර්ථික විද්‍යාව I
# Economics I

කාලය පැය 01

Learning Resource Center
R
De Mazenod College
Kandana

01. ආර්ථික විද්‍යාවේ දී හදාරනු ලබන්නේ,
   1. සම්පත් හිඟකම හා පූර්ණ සේවා නියුක්තිය පිළිබඳව ය.
   2. සම්පත් හිඟකම හා නිෂ්පාදනය පිළිබඳව ය.
   3. සම්පත් හිඟකම හා තෝරා ගැනීම පිළිබඳව ය.
   4. සම්පත් හිඟකම හා කාර්යක්ෂමතාව පිළිබඳව ය.
   5. සම්පත් හිඟකම හා ආදේශකතාව පිළිබඳව ය.

02. ආර්ථික විද්‍යාවේ දී ආවස්ථික පිරිවැය වශයෙන් නිර්වචනය කරන්නේ,
   1. යමක් ලබා ගැනීම වෙනුවෙන් කැප කළ අනෙකුත් අවස්ථායි.
   2. යමක් ලබා ගැනීම සඳහා වැය වූ මූල්‍ය පිරිවැයයි.
   3. යමක් ලබා ගැනීම සඳහා ගත වූ කාලයේ පිරිවැයයි.
   4. යමක් ලබා ගැනීම සඳහා වැය වූ ස්ථාවර හා විචල්‍ය පිරිවැයේ එකතුවයි.
   5. යමක් ලබා ගැනීම වෙනුවෙන් අත්හරින ලද හොඳම විකල්පයේ වටිනාකමයි.

03. ආර්ථික විද්‍යාවේ 'හිඟකම' සංකල්පනයෙන් අදහස් කරනුයේ,
   1. සමාජය තමන් සතු සියලු සම්පත් කාර්යක්ෂමව උපයෝජනය නොකරන තත්ත්වයකි.
   2. පවත්නා සම්පත් වලින් මිනිසුන්ගේ වුවමනා කිසිසේත් සපුරාගත නොහැකි තත්වයකි.
   3. සෑම සමාජයකම කිසියම් සාමාජික පිරිසක් දිළින්දන් ලෙස ජීවත් වන තත්ත්වයකි.
   4. සමාජීය වශයෙන් හිතකර භාණ්ඩ හා සේවා නිපදවනවා වෙනුවට, නොවැදගත් භාණ්ඩ හා සේවා වුවමණාවටත් වඩා නිපදවන තත්ත්වයකි.
   5. නිෂ්පාදනය කාර්යක්ෂම වුවත් බෙදා හැරීම අකාර්යක්ෂම ව පවතින තත්ත්වයකි.

04. පහත දැක්වෙන දෑ අතුරෙන් ආර්ථික භාණ්ඩයක ලක්ෂණ නිවැරදි ව පිළිබිඹු කරන පිළිතුර තෝරන්න.
   - A. නිෂ්පාදන පිරිවැයක් පැවතීම.
   - B. ආවස්ථික පිරිවැයක් පැවතීම.
   - C. පාරිභෝගිකයා විසින් වියදමක් දැරීම.
   - D. අඩුවන ආන්තික පිරිවැයක් පැවතීම.

   1. A සහ B ය. 2. A සහ C ය. 3. A, B සහ C ය. 4. A, C සහ D ය. 5. B, C සහ D ය.

05. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් සූක්ෂම ආර්ථික විද්‍යාත්මක ප්‍රකාශනයක් වනුයේ කවරක් ද?
   1. පසුගිය වසරේ දී රබර් මිල 10% කින් පහළ වැටුණි.
   2. පසුගිය වසරේ දී විරැකියාව ශ්‍රම හමුදාවෙන් 5.8% ක් වූයේ ය.
   3. පසුගිය වසරේ දී මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 7% කින් ඉහළ ගියේ ය.
   4. පසුගිය වසරේ දී පොදු මිල මට්ටම 4% කින් වැඩි විය.
   5. පසුගිය වසරේ දී රජයේ බදු අයහාරය 8% කින් අඩු විය.

06. ආර්ථික පද්ධතියක් තුළ තීරණ ගනු ලබන ප්‍රධාන කණ්ඩායම් තුන වනුයේ,

1. කුටුම්බ, ව්‍යාපාරික ආයතන සහ බැංකු වේ.
2. කුටුම්බ, ව්‍යාපාරික ආයතන සහ රජය වේ.
3. ව්‍යාපාරික ආයතන, රජය සහ රාජ්‍ය නොවන සංවිධාන වේ.
4. ව්‍යාපාරික ආයතන, බැංකු සහ විදේශ වෙළෙඳමේ නිරතවූවන් වේ.
5. කුටුම්බ, රජය සහ බැංකු වේ.

07. කිසියම් කටයුත්තක ආවස්ථික පිරිවැය,

1. එබඳු කටයුතු කරන සියල්ලන්ට ම එක සමාන වේ.
2. එම කටයුත්තෙහි මූල්‍ය පිරිවැය පමණක ඇතුළත් කර ගනී.
3. එම කටයුත්ත නිසා කැප කරන්නට සිදු වූ ආදායම් පමණක් ඇතුළත් කර ගනී.
4. එම කටයුත්ත නිසා හට ගන්නා සෘජු ප්‍රතිලාභ පමණක් මිනුම් කරයි.
5. ඉහත කිසිවක් නොවේ.

08. කිසියම රටක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත,

1. තාක්ෂණය වෙනස් වෙමින් පවතී.
2. අනික් භාණ්ඩයේ නිෂ්පාදනය අඩු නොකොට, කිසියම් භාණ්ඩයක් වැඩිපුර නිපදවිය හැකි ය.
3. නිෂ්පාදන සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය නොවේ.
4. පවත්නා සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය වේ.
5. ආර්ථිකයේ නිෂ්පාදන කාර්යක්ෂමතාවයක් පවතී.

09. නිෂ්පාදන හැකියා මායිමෙන් ඇතුළත ලක්ෂ්‍යයකින් පෙනෙන්නේ,

1. සම්පත් අවභාවිතයයි.
2. සම්පත් හිඟකමයි.
3. යල් පැන ගිය තාක්‍ෂණයයි.
4. සම්පත් අධි භාවිතයයි.
5. නුපුහුණු ශ්‍රමය පැවතීමයි.

10. සෑම ආරථික කටයුත්තකදී ම නිෂ්පාදන සම්පත් එකිනෙකට පූර්ණ ආදේශක වේ නම්, පහත සඳහන් දෑ අතුරෙන් කවරක් නිවැරදි වේද?

1. සියලුම භාණ්ඩවල නිමැවුම වැඩි කළ හැකි ය.
2. විශේෂ ප්‍රාගුණ්‍යනය සහ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වෙළෙඳාමක් හට ගැනීමට ඉඩක් නොපවතී.
3. කිසිදු රටක් හෝ කිසිදු පුද්ගලයෙක් හෝ කිසිදු කටයුත්තක් සම්බන්ධයෙන් සාපෙක්ෂ වාසි අත්කර ගැනීමට අසමත් වේ.
4. නිෂ්පාදන සම්පත් හිඟය අහෝසි වී යනු ඇත.
5. එක් භාණ්ඩයක් නිෂ්පාදනය වැඩි කිරීමට අනෙක් භාණ්ඩයෙන් කැපකළ යුතු ප්‍රමාණය සෑම විටම සමාන වනු ඇත.

11. 'මානව ප්‍රාග්ධනය' යන්නෙන් අදහස් කරනුයේ,

1. ප්‍රාග්ධන උපකරණ නිපදවීමට යොදා ගැනෙන ශ්‍රම සම්පතයි.
2. ගොඩනැගිලි හා යන්ත්‍ර සූත්‍රයි.
3. ශ්‍රම හමුදා සතු කුසලතා සහ දැනුම් සම්භාරයයි.
4. ව්‍යවසායකත්වය සහ අවදානම් දැරීමේ හැකියාවයි.
5. සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි සේවා නියුක්ත ශ්‍රම හමුදාවයි.

12. විභව නිමැවුම යනු,

1. පසුගිය දස වසර තුළ ආර්ථිකයක් සැබවින්ම අත්කර ගත් උපරිම දළ දේශීය නිෂ්පාදිතය වේ.
2. සමස්ත ශ්‍රම හමුදාව ම වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදන අංශයේ සේවා නියුක්ත වූ කාල පරිච්ඡේද වලදී අත්කර ගත් නිමැවුම වේ.
3. සියලු සම්පත් වඩා කාර්යක්ෂමව යොදා ගැනීමෙන් ආර්ථිකයට කිසිවිටක අත්කර ගත නොහැකි අරමුණකි.
4. ආර්ථිකයේ සම්පත් පූර්ණ සේවා නියුක්තව, ප්‍රශස්ත මට්ටමින් උපයෝජනය කරන විට නිපදවිය හැකි දළ දේශීය නිෂ්පාදිතය වේ.
5. ආර්ථිකයේ සම්පත් පූර්ණ සේවා නියුක්තව, උපරිම මට්ටමින් උපයෝජනය කරන විට නිපදවිය හැකි දළ දේශීය නිෂ්පාදිතය වේ.

13. ධනවාදය පදනම් කරගත් ආර්ථිකයක පහත දැක්වෙන එක් කරුණක් හැර අන් සියල්ල දක්නට ලැබේ. එලෙස දක්නට නොලැබෙන කරුණ වනුයේ,

1. ඉල්ලුම හා සැපයුම මත පදනම් වූ මිල ක්‍රමයයි.
2. පෞද්ගලික දේපළ ක්‍රමයයි.
3. ස්වාර්ථය මත කටයුතු කරන කුටුම්බ සහ ව්‍යවසායකයන් ය.
4. ව්‍යවසායක නිදහසයි.
5. මධ්‍යගත සැලසුම්කරණයයි.

14. ආර්ථිකය තුළ ආණ්ඩුවේ සහභාගීත්වය වඩාත් ප්‍රබල ලෙස දක්නට ලැබෙන්නේ,

1. වෙළෙඳපොළ ආර්ථිකයක ය.
2. විධානගත ආර්ථිකයක ය.
3. මිශ්‍ර ආර්ථිකයක ය.
4. සමාජ වෙළෙඳපොළ ආර්ථිකයක ය.
5. සාම්ප්‍රදායික ආර්ථිකයක ය.

15. වෙළෙඳපොළ ආර්ථිකයක මිලෙහි කාර්යයන් වන්නේ,

1. සලාක කිරීම සහ වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම ය.
2. සංඥා සැපයීම, සානුබල සැපයීම සහ වටිනාකමේ මිනුමක් ලෙස ක්‍රියා කිරීම ය.
3. සංඥා සැපයීම, සානුබල සැපයීම සහ වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම ය.
4. සානුබල සැපයීම සහ වටිනාකමේ මිනුමක් ලෙස ක්‍රියා කිරීම ය.
5. සංඥා සැපයීම, සානුබල සැපයීම සහ සලාක කිරීම ය.

16. වෙළෙඳපොළ ආර්ථිකයක පුද්ගල ආදායම තීරණය වනුයේ,

1. රජයේ සාධක මිල ප්‍රතිපත්තියසහ පිහිටාධාර මත ය.
2. සාධක වෙළෙඳපොළේ සාධක මිල සහ පෞද්ගලික ආදායම් බදු මත ය.
3. සාධක වෙළෙඳපොළේ සාධක මිල සහ රජයේ වැටුප් ප්‍රතිපත්තිය මත ය.
4. සාධක වෙළෙඳපොළේ සාධක සඳහා පැවති මිල සහ එම මිලට හුවමාරුවන ප්‍රමාණය මතය.
5. දෙපළ හිමිකම සහ සාධක වෙළෙඳපොළේ සාධක මිල මත ය.

17. බාහිරතා නොමැති තරඟකාරී වෙළෙඳපොළක සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව හටගනු ඇත්තේ සියලු වෙළෙඳපොළවල මිල

1. මුළු පිරිවැයට සමාන වන විටදී ය.
2. ආන්තික අයභාරයට සමාන වන විටදී ය.
3. ආන්තික පිරිවැයට සමාන වන විටදී ය.
4. සාමාන්‍ය විචල්‍ය පිරිවැයට සමාන වන විටදී ය.
5. ආන්තික නිෂ්පාදිතයේ වටිනාකමට සමාන වන විටදී ය.

18. නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක පහත සඳහන් කවර කරුණක් සාවද්‍ය ද?

1. මිල, ආර්ථිකයේ තරඟකාරී නිෂ්පාදන ක්ෂේත්‍ර අතර සම්පත් සමසේ බෙදා වෙන් කරයි.
2. මිල, භාණ්ඩ හා සේවාවන්හි සාපෙක්ෂ හිඟකම සහ ඒවායේ නිෂ්පාදන පිරිවැය පෙන්නුම කරයි.
3. සාපේක්ෂ මිල වෙනස්කම්, නිෂ්පාදන ආයතනවල ලාභ නිර්ණය කරන සාධකයන් වන අතර, එබැවින් එය නිෂ්පාදනය ධෛර්යමත් කිරීමට හෝ අධෛර්යමත් කිරීමට හෝ බලපායි.
4. මිල භාණ්ඩ හා සේවා සඳහා පාරිභෝගිකයන්ගේ ගෙවීමට ඇති කැමැත්ත පිළිබඳ මිනුමක් වේ.
5. මිල භාණ්ඩයක් ලබා ගැනීම සඳහා කොපමණ කැප කළ යුතු ද යන්න පිළිබඳ සංඥාවක් පාරිභෝගිකයන්ට ලබා දෙයි.

19. ආර්ථිකයක සම්පත් බෙදා වෙන් කිරීම සඳහා මිල යන්ත්‍රණය යොදා ගත් විට, වෙළෙඳපොළ මිල ගණන්,

1. ඉහළ යා යුතු ය.
2. සාමාන්‍යයෙන් රජයේ නියාමනයට ලක් කෙරේ.
3. මූලමනින් ම නිෂ්පාදන පිරිවැය මත ම තීරණය වේ.
4. ඉල්ලුම වෙනස් වීම කෙරෙහි ප්‍රතිචාර නොදක්වයි.
5. ඉහත කිසිවක් නොවේ.

20. ඉල්ලුම වක්‍රයක් ඇඳීමේ දී ස්ථාවර ව පවතින්නේ නැතැයි සලකනුයේ පහත සඳහන් දෑ අතුරෙන් කවරක් ද?

1. පාරිභෝගිකයන්ගේ මුදල් ආදායම
2. පාරිභෝගිකයන්ගේ අභිරුචිය
3. එම භාණ්ඩයේ මිල
4. ආදේශක භාණ්ඩවල මිල
5. ඉහත සියල්ලම

දි මැසිනොද් විදුහල - කඳාන
De Mazenod College - Kandana

21 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 12 ශ්‍රේණිය
2016 නොවැම්බර් පරීක්ෂණය

24-11-2016

# ආර්ථික විද්‍යාව II
# Economics II

කාලය පැය 02

De Mazenod College Kandana

**ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න.**

(1) i. ආර්ථික විද්‍යාව ස්වභාවික විද්‍යාවන් ගෙන් වෙනස් වන්නේ කෙසේ ද? (ලකුණු 04)

ii. ආර්ථික විද්‍යාව ඉගෙනීමේ ප්‍රායෝගික වැදගත්කම කවරේ ද? (ලකුණු 04)

iii. අවශ්‍යතා හා උවමනා අතර වෙනස පැහැදිලි කරන්න. ලකුණු 04)

iv. ආර්ථික සම්පත් හා ආර්ථික නොවන සම්පත් අතර වෙනස දක්වන්න. (ලකුණු 04)

v. ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත් හා ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත අතර වෙනස දක්වන්න. (ලකුණු 04)

(2) i. ආර්ථික සම්පත්වල ප්‍රභේද 04 කවරේ ද? එක් එක් ප්‍රභේදය සඳහා නිදසුන බැගින් සපයන්න. (ලකුණු 04)

ii. ආර්ථික විද්‍යාව තුළ ප්‍රාග්ධන සම්පතක් වශයෙන් මුදල් නොසැලකෙන්නේ ආයි? (ලකුණු 04)

iii. ආර්ථිකමය වශයෙන් අක්‍රිය ජනගහනය වශයෙන් කුමක් අදහස් වේද? ඒ සඳහා ඔබ ඇතුළත් කරන දෑ සඳහන් කරන්න. (ලකුණු 04)

iv. රටක ආර්ථික වර්ධනය ඉහළ දැමීම සඳහා අවශ්‍ය ප්‍රධාන තීරණය ආයෝජනයයි. රටක ආයෝජනය තීරණය කරන ප්‍රධාන සාධක කවරේ ද? (ලකුණු 04)

v. ව්‍යවසායකයකු යනු කවරෙක් ද? ආර්ථිකයක ව්‍යවසායකත්වයේ ප්‍රධාන කාර්යයන් කවරේ ද? (ලකුණු 04)

(3) i. සම්පත් හිඟකම යන්නෙන් කුමක් අදහස් වේද? හිඟකම පවතින විට අවශ්‍යයෙන්ම තේරීම් කළ යුත්තේ මන්ද? (ලකුණු 04)

ii. ආවස්ථික පිරිවැය යනුවෙන් කුමක් අදහස් වේද? ආර්ථිකයක ආවස්ථික පිරිවැයක් දැකිය නොහැකි අවස්ථා මොනවා ද? (ලකුණු 04)

iii. ''ජලය ස්වභාව ධර්මයේ දායාදයක් බැවින් එය ආර්ථික භාණ්ඩයක් නොවේ.''ඔබ එකඟ වේද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. භාණ්ඩ වෙළෙඳපොළ සහ සාධක වෙළෙඳපොළ අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

v. සලකා බලන භාණ්ඩයේ මිල අඩුවීමේ ආදායම් ප්‍රතිවිපාකයහා ආදේශන ප්‍රතිවිපාකය නිර්වචනය කරන්න. (ලකුණු 04)

(4) i. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් යනු කුමක් ද? නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් අඳින විට ඔබ උපකල්පනය කරන දෑ නම් කරන්න.

(ලකුණු 04)

ii. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් පිටතට විතැන් වීමට බලපාන හේතු කවරේ ද?

(ලකුණු 02)

iii. වැඩෙන ආවස්ථික පිරිවැය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ හැඩය සම්බන්ධයෙන් මෙම සංකල්පයෙන් ගම්‍ය වන්නේ කවරක් ද?

(ලකුණු 04)

iv. වී සහ රෙදිපිළි නිෂ්පාදනයේ දී වැඩෙන ආවස්ථික පිරිවැය තත්ත්වයට මුහුණ දෙන රටක් සඳහා නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් අඳින්න. පහත සඳහන් සිදුවීම් නිසා නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වෙනස් වන්නේ කෙසේදැයි පෙන්වා දෙන්න.

(අ) වඩාත් හොඳ පොහොර වර්ගයක් අලුතින් සොයා ගැනීම.

(ආ) නිෂ්පාදන ක්ෂේත්‍ර දෙකෙහිම සේවා නියුක්ත කළ හැකි ශ්‍රම ප්‍රමාණයේ විශාල ප්‍රසාරණයක් හට ගැනීම.

(ඉ) දැඩි ඉඩෝරයක් නිසා වගා කළ හැකි ගොවිබිම් ප්‍රමාණය 10% කින් අඩුවීම.

(ඊ) නිෂ්පාදන පිරිවැය අඩු කෙරෙන නව තාක්ෂණයක් රෙදිපිළි කර්මාන්තය තුළ සොයා ගැනීම.

(ලකුණු 06)

v. නිෂ්පාදන කාර්යක්ෂමතාව සහ සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව අතර වෙනස දක්වන්න.

(ලකුණු 04)

(5) i. ආර්ථික පද්ධතියක් යනුවෙන් කුමක් අදහස් වේද? ආර්ථික පද්ධතියක කාර්යභාරය කවරේ ද?

(ලකුණු 04)

ii. ආර්ථික පද්ධතීන් අතර විවිධත්වයක් දක්නට ලැබෙන්නේ කවර හේතූන් නිසාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 04)

iii. වෙළෙඳපොළ ආර්ථිකයක ප්‍රධාන ලක්ෂණ කවරේ ද?

(ලකුණු 04)

iv. මධ්‍යගත සැලසුම් ආර්ථිකයක වාසි 02 ක් හා අවාසි 02 ක් සඳහන් කරන්න.

(ලකුණු 04)

v. ආර්ථික පද්ධති ඇගයීම සඳහා යොදා ගනු ලබන නිර්ණායකයන් කවරේ ද?

(ලකුණු 04)